# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2300/27 - 2022 ඔක්තෝබර් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**රේගු නිවේදනයයි**

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 05/2022

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

**කේ. එම්. මහින්ද සිරිවර්ධන,**
ලේකම්,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

2022 ඔක්තෝබර් මස 06 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

1A - PG 5994 — 481 (2022/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www. documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

ආඥාව

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, (235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වූ 2021 මාර්තු මස 24 වැනි දිනැති අංක 2220/42 *දරන ගැසට් නිවේදනයේ* ඇමුණුම II හි රේගු බද්දෙන් නිදහස් භාණ්ඩ ලැයිස්තුව (ආනයන) සඳහා, මෙහි වූ අංක 42 වශයෙන් සඳහන් නව අයිතමය, 2022 ඔක්තෝබර් මස 07 වැනි දින සිට ඇතුළත් කිරීමට මෙම ආඥාව මගින් නියම කරමි.

42. දේශීය සනීපාරක්ෂක තුවා නිෂ්පාදකයන් විසින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 3920.10.20 (පොලිඑතිලීන් පටල - නැප්කින් හා සනීපාරක්ෂක තුවා නිෂ්පාදනය කරන්නා වූ වර්ගයකට අයත් ලෝහ නොගැන්වූ පළල මි.මී. 110ට වැඩි නමුත් මි.මී. 230ට නොවැඩි), 3920.10.90 (අනෙකුත් - පොලිඑතිලීන් පටල (ඩබ්)), සහ 3926.90.99 (අනෙකුත් පොලිප්‍රොපිලීන් පටල) යටතේ වර්ගීකරණය වන අමුද්‍රව්‍ය හෝ අන්තර් භාණ්ඩ ආනයනය, කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ
සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 06 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 10 - 0037

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.